**වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - අතුරුගිරිය

**2026/2027 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මගින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුබද්ධව ස්ථාපිත කොට ඇති අතර වැවිලි ක්ෂේත්‍රයෙහි නියුතුවන්නන්ගේ හා නියැලීමට උනන්දුවක් දක්වන පාර්ශව සඳහා අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් මෙරට තුළ ස්ථාපිත එකම රාජ්‍ය ආයතනය වේ.

2026/2027 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් පාඨමාලා ද්විත්වයට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. වැවිලි ව්‍යාපාරිකරණ කළමනාකරණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - (NVQ අදියර 05)

කාලසීමාව - අවුරුදු 2 යි (50% මාර්ගස්ථව ද, 50% ආයතනයේ දී සති අන්ත දේශන වශයෙන් ද පවත්වනු ලැබේ.)

මාධ්‍යය - ඉංග්‍රීසි/ සිංහල

පාඨමාලා ගාස්තුව - රු. 165,000.00

ඇතුළත් වීමේ සුදුසුකම් :

අ.පො.ස. (උ/පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් තුනක් (03) සමත් වීම;

*හෝ*

කෘෂිකර්මයට හෝ වැවිලි ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

02. වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - (NVQ අදියර 05)

කාලසීමාව - අවුරුදු එකයි මාස හයයි.
අදියර I - අවුරුදු 01 ක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාව
අදියර II - මාස 06 ක ප්‍රායෝගික පුහුණුව

මාධ්‍යය - ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව - රු. 165,000.00

ඇතුළත්වීමේ සුදුසුකම් :

අ.පො.ස. (උ/පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් තුනක් (03) සමත් වීම;

*හෝ*

කෘෂිකර්මයට හෝ වැවිලි ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**අයදුම්කරන ආකාරය :**

මෙම වැඩසටහන සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 මාර්තු මස 20 හෝ ඊට පෙර පහත දක්වා ඇති ආකෘතියෙන් අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, M.D.H. ජයවර්ධන මාවත, අතුරුගිරිය, ශ්‍රී ලංකාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ www.nipm.gov.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා :

070-6645133
077-6441028
0112770232